නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - දකුණු පළාත
பிரதி பிரதம செயலாளர் (பொறியியல் சேவை) - தென் மாகாணம்
Deputy Chief Secretary (Engineering Services) - Southern Province

දකුණු පළාත් ඉංජිනේරුසේවා කාර්යාලය - කොටුව, ගාල්ල.
தென்மாகாணப் பொறியியல் சேவைக் காரியாலயம் - கோட்டை, காலி.
Southern Provincial Engineering Services Office, Fort, Galle.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
Deputy Chief Secretary (Engineering Service) : Tel/Fax: 091-2242786

විද්‍යුත් තැපැල
E- mail : gaks@sltnet.lk / info-eng@cs.spgov.lk

| මගේ අංකය My No. | SPES/1/2 | ඔබේ අංකය Your No. | | දිනය Date | 2020/04/20 |
|---|---|---|---|---|---|

අභ්‍යන්තර චක්‍රලේඛ අංක 02-2020

කාර්යාලයේ සියලුම නිලධාරීන් වෙත,

**COVID – 19 වෛරසය පවතින කාලය අතරතුර සාමාන්‍ය කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික්ක විවෘත කිරීමේදී රාජ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ**

ඉහත කරුණට අදාලව 2020.04.18 දිනැති රජයේ මාධ්‍ය නිවේදන අංක 63 සම්බන්ධයෙනි.

02. ඒ අනුව 2020.04.20 දින සිට සේවයට වාර්තා කරන නිලධාරීන් කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා කාර්යාල පරිශ්‍රයේ පහත සඳහන් සෞඛ්‍ය ආරක්ෂක පියවර අනුගමනය කල යුතු බව කාරුණිකව දන්වමි.

I. කාර්යාලයට ඇතුල්වීමට පෙර පිරිසිදු කාරක දියරයකින් අත් සේදීම මුහුණ ආවරණ පැළඳ පැමිණීම

II. කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම දිනකට 3 වරක් පමණවත් සිදු කර ගැනීමට සනීපාරක්ෂක සේවා සපයන අයගෙන් ඉටු කරවා ගැනීම

III. පිටස්තර සේවාලාභීන් කාර්යාලය වෙත පැමිණෙන විට ඔවුන්ට සනීපාරක්ෂ දියර මෙන්ම ජලය, සබන් යොදා දෙඅත් සෝදා ගැනීමට පහසුකම් සලසා දීම

IV. අත්‍යවශ්‍යයෙන් සහභාගී විය යුතු නිලධාරීන් පමණක් සහභාගී කර ගනිමින් රැස්වීම සංවිධානය කිරීම

V. කාර්යාල පරිශ්‍රයේ නිලධාරීන් අතර නියමිත දුරස්ථ භාවය අනුගමනය කිරීම

VI. යම් නිලධාරියෙකු හට උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව සහ රෝග ලක්ෂණ පවතීනම් ඒ බව අංශ ප්‍රධානියා වෙත දුරකථනය මඟින් දැන්වීම

VII. කාර්යාලය සතියේ දින 05 තුල විවෘත කර තැබීම කල යුතු අතර, සෑම අංශයකින්ම නියෝජනය වන ලෙසට දිනපතා 50% ක පමණ නිලධාරීන් ප්‍රමාණයක් සේවයේ නිරත විය යුතුය. ඉතිරි 50% ක නිලධාරීන් නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කල යුතුය.

VIII. නිවසේ සිට රාජකාරි ඉටුකරනු ලබන නිලධාරින්ගේ රාජකාරි පිළිබඳ වාර්තාවක් අංශ ප්‍රධානින් වෙත ඉදිරිපත් කල යුතු අතර, සෑම විටම දුරකථන මඟින් සම්බන්ධීකරණය වීමට හැකිවන ආකාරයට කටයුතු කිරීම.

IX. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු www.president.gov.lk වෙබ් අඩවිය මඟින් රාජ්‍ය මාධ්‍ය නිවේදනයෙන් දැනුවත් විය හැක.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වැ.බ,

දකුණු පළාත

ඉංජිනේරු ඒ. රණසිංහ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි. සේවා) වැ.බ
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි. සේවා) කාර්යාලය
කොටුව - ගාල්ල.

පිටපත් 01. පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ
02. ප්‍රධාන වාස්තු විද්‍යාඥ
03. ගණකාධිකාරි
04. පරිපාලන නිලධාරි

කරු. අ.ක.ස